**<u>වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 13 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

පැමිණීම

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ජී නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
05. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
06. ගරු මන්ත්‍රී - ජී.එස්.ජී ෆොන්සේකා මහතා
07. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
08. ගරු මන්ත්‍රී - එස්.ජී.ටී පුෂ්පකුමාර මහතා
09. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය
10. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
11. ගරු මන්ත්‍රී - ජී.ජී.ටී.ජී සිරිසේන මහතා
12. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
13. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
14. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
15. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය

නොපැමිණීම

01. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
02. ගරු මන්ත්‍රී - ටී.ජී.ඩී.සී දමයන්ති මිය
03. ගරු මන්ත්‍රී - එච්.ජී.එන්.සී රණසිංහ මහතා
04. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
05. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා

**<u>01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම</u>**

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ජී ෆොන්සේකා මහතා</u>

2022 දෙසැම්බර් මස මහා සභා වාර්තාව හා 2023.01.03 දින පැවති විශේෂ මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ජී.ටී පුෂ්පකුමාර මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 දෙසැම්බර් මස මහා සභා වාර්තාව හා 2023.01.03 දින පැවති විශේෂ මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

<u>02 - 01 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රොසැල්ල හයිඩ්‍රිවත්ත ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයට ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමියන්ගේ ප්‍රතිපාදන මුදලින් සාස්පාන් කට්ටලයක් ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 38,300.00 ක මුදලක් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 02 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයින්ෆෝඩ් බී ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී කටුකිතුලේ සෝමරතන ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය සඳහා අවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 20,500.00 ක මුදලක් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 03 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙරළුගොල්ල හන්දිය, දෙකිඳ පාර, නාවලපිටිය ලිපිනයේ පදිංචි එම්. ජී. සම්පත් කුමාර ජයසිංහ මහතා 2021 වර්ෂයේ තායිලන්තයේ පත්වන ලද මුයිතායි ලෝක ශූරතාවලියට සහභාගී වීම වෙනුවෙන් සභා අරමුදලින් රු.10,000.00 ක මුදලක් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 04 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හයිඩ්‍රි ග්‍රාම සේවා වසමේ ග්ලිස්ටන්ගම රොසැල්ල පිහිටි ශ්‍රී ඥාන ගනේෂර කෝවිලට අඩි 1 ½ ක් උසැති මුහුණු පහක් සහිත පිත්තල ශ්‍රී ඥාන ගනේෂර දේව රූපයක් ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් රු.350,000.00 ක මුදලක් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 05 නියෝජ්‍ය අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල</u>

Proposed Durian Cultivation Project at Nagasthenna Estate, Yatiyantota යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
2022.09.15 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය, රඹුක්පිටිය
මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය සඳහා ස්ථානයක් ලබා ගැනීම සඳහා යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ “ නාවලපිටිය බව්වාගම සිරි ධම්මරතන පිරිවෙන් විහාරාධිපති පූජ්‍ය පොල්ගස්වත්තේ ජිනරතන ලොකු හාමුදුරුවන් වහන්සේගේ ” ආදාහන පූජෝත්සවය වෙනුවෙන් අදන පිරිකර පූජා කිරීම සඳහා සභා අරමුදලින් රු. 44,000.00 ක මුදලක් වියදම් දැරීම යන ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

i. මාර්ගය පුළුල් කිරීම සඳහා මා ලබා දුන් බිම් ප්‍රමාණය වෙනුවට මා වෙත ලබා දුන් බිම් ප්‍රමාණය නිරාකරනය නොකිරීම සම්බන්ධවයි
ii. අනවසර ඉදිකිරීමක් සම්බන්ධවයි
iii. අක්‍රමවත්ව ඉදිකළ තාප්පයක් නිසා මාර්ගය අවහිර වීම සම්බන්ධවයි

උක්ත කරුණු සම්බන්ධව එස්. එම්. ගාමිණී සමරතුංග මහතා, එස්. එම්. විපුල පුෂ්පකුමාර මහතා හා කුමාරි වීරකෝන් මහත්මිය යන අය විසින් පළාත් පාලන කොමසාරිස් වෙත යවන ලද ලිපියට පිළිතුරු ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

02 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි සභාගත කිරීම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කඩියන්ලෙන උප තැපැල් කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ල වර්ෂා කාලවලදී අධික ලෙස ජලය කාන්දු වී තෙමීමට ලක්වන නිසා හා වහලය දිරාපත් වී ඇති බැවින් කඩා වැටීමටද ඉඩ ඇති නිසා එය අලුත්වැඩියා කර දෙන ලෙස කඩියන්ලෙන උප තැපැල් ස්ථානාධිපති විසින් ඉල්ලීමක් කර ඇත. අප සභාව මඟින් එම ගොඩනැඟිල්ල සඳහා දැනට මසකට කුලිය ලෙස රු. 750.00 ක මුදලක් පමණක් අය කරන බැවින් දැනට සභා අරමුදලින් අලුත්වැඩියා කිරීම ගැටළුකාරී බැවින් මසක කුලී මුදල වැඩි කර එමඟින් අලුත්වැඩියාව සිදු කිරීමටත්, තාක්ෂණ නිලධාරි මඟින් එම අලුත්වැඩියාව සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීමටත්, එම ගොඩනැඟිල්ලේ විදුලි බිල ගෙවීම සම්බන්ධව සොයා බැලීමටත් එම ගොඩනැඟිල්ලේ අනෙක් කොටස මිල ගණන් කැඳවා ටෙන්ඩර් කර බඳු පදනම යටතේ ලබා දීම සඳහා සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණියේ දිනිඳු වික්‍රමසිංහ මයා, දීපාල් දිනේෂ් මයා හා ජානක සේනාරත්න මයා වෙත නිල ඇඳුම් දීමනාව ලෙස රු. 4,000.00 ක දීමනාවක් ලබා දීම සඳහා සහ අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.
ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.
05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ කම්කරු එච්. එම්. ලහිරු චාමර මයා සහ කම්කරු ආර්. නාගේන්ද්‍රන් මයා විසින් ඉල්ලීම් කර ඇති නිල ඇඳුම් දීමනාව ලෙස රු. 4,000.00 ක දීමනාවක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2023 ජනවාරි මස මහා සභාව වෙනුවෙන් ගෙවනු ලබන සභික දීමනාව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය වන තෙක් එම දීමනාව සභා අරමුදලින් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරලේ බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් ප්‍රතිසංස්කරණය සඳහා තාක්ෂණික ඇඟයීම් කමිටුවට සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා වශයෙන් රු. 42,000.00 ක මුදලක් ගෙවීමට හා මාණ්ඩලික නිලධාරීන්ට, ලිපිකරු නිලධාරීන්ට හා සෙසු නිලධාරීන්ට තාක්ෂණික ඇඟයීම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා වශයෙන් රු. 11,000.00 ක මුදලක් ගෙවීම සුදුසු බව 2022.12.15 දිනැති මහා සභාවේ තීරණ අංක 05-24 යටතේ සභා සම්මත වී ඇත. එහෙත් එක් එක් පාලම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල අනුව ගෙවිය යුතු දීමනාව වෙනස් වීම හේතුවෙන් තාක්ෂණික ඇඟයීම් කමිටුවට සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා වශයෙන් රු. 86,000.00 ක් හා මාණ්ඩලික නිලධාරීන්ට, ලිපිකරු නිලධාරීන්ට හා සෙසු නිලධාරීන්ට තාක්ෂණික ඇඟයීම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා වශයෙන් රු. 19,000.00 ක මුදලක් ගෙවිය යුතු වේ. ඒ අනුව ගෙවිය යුතු මුලු මුදල රු. 105,500.00 ක් වේ. එබැවින් එම මුදලින් 2022.12.30 දින වවුචර අංක 1817 න් ගෙවන ලද රු. 53,000.00 ක මුදල අඩු කර රු. 52,500.00 ක් මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබා දීම යන මැයෙන් වන පළාත් පාලන චක්‍රලේඛ අංක 2022/01 අනුව පාරිභෝගිකයන්ට ගෙවීම් කිරීම සඳහා CAT 2020 පරිගණක මෘදුකාංගය ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසු පරිගණකයක් මිලදී ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය බැංකු කටයුතු වෙනුවෙන් මහජන බැංකුව වෙත තැන්පතුවක් තැබිය යුතු වුවද ලංකා බැංකුවේ එලෙස අවශ්‍ය නොවන බැවින් ප්‍රාදේශිය සභාව නමින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම නාවලපිටිය ලංකා බැංකුව වෙත මාරු කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
2018 වසරේ සිට පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ ක්‍රියාත්මක කරන ලද මැහුම් පාඨමාලාවේ උපදේශිකාව ලෙස කටයුතු කල කැටඹුලාව, කඩියන්ලෙන, ආවාස පාර අංක 13/7 ලිපිනයෙහි පදිංචි එල්. එච්. චාන්දනී වික්‍රමසිරි මියගේ ඉල්ලීම පරිදි 2023 වර්ෂය සඳහා වන මැහුම් පාඨමාලාවේ උපදේශිකාව ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.
මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 –08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් JCB යන්ත්‍රය කළු දුම දැමීම හා ධාවනය නොවීම නිසා එය අලුත්වැඩියා කර දෙන ලෙස JCB යන්ත්‍ර ක්‍රියාකරු විසින් කරන ලද ඉල්ලීමට අනුව එහි අලුත්වැඩියාවන් සම්බන්ධව ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඉංජිනේරු තැනගෙන් වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
කැටඹුලා (තැපැල්) කඩියන්ලෙන ජනපදය අංක 128 ලිපිනයේ පදිංචි ඒ. ශන්මුරාජා මයා විසින් මාර්ගයේ ගලා බසින වැසි ජලය තම ඉඩමට ගලා ඒමට සලස්වා ඇති බවත් මේ හේතුවෙන් තම ඉඩම සෝදා පාළුවට ලක් වන බවත් එබැවින් මෙම බෝක්කු බටය ඉවත් කර දෙන ලෙසත් සඳහන් කරමින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව කාර්මික නිලධාරී හා පරිසර නිලධාරී විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවට අනුව සත්‍ය වශයෙන්ම වැසි ජලය හේතුවෙන් හානියක් සිදු වුවද මේ වන විට කාණු පද්ධතිය හා බෝක්කුව පිහිටා ඇති ස්වභාවය සහ ප්‍රෙද්ශවාසීන්ගේ බලවත් විරෝධය හමුවේ විකල්ප ක්‍රියාමාර්ගයක් සඳහා ඉතා සීරුවෙන් කටයුතු කළ යුතු බව නිරීක්ෂණය වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගැටුම් සමථකරණ කමිටුව සාකච්ඡා කොට ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 –10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ නෑණසල උපදේශක දීමනාව වන රු. 7,000.00 ක දීමනාව 2023 වසරේ සිට මසකට රු. 10,000.00 දක්වා වැඩි කර ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 11 ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. රඹුක්පිටිය පන්සල මාර්ගයේ කඩතොළු වැසීම සඳහා ප්‍රිමික්ස් යෙදීම
2. සිල්වාස්ලැන්ඩ් වටරවුම් මාර්ගයේ බෝක්කු බට යොදා මාර්ගයේ කඩතොළු ප්‍රිමික්ස් දමා වැසීම
3. ආරාමය මාර්ගයේ කඩතොළු ප්‍රිමික්ස් දමා වැසීම
4. ක්‍රවුදස්ලැන්ඩ් මාර්ගය ABC යොදා මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කර කඩතොළු ප්‍රිමික්ස් දමා වැසීම

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 12 ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල වරකාව ගම මැද මාර්ගයේ පැච් වැසීම සඳහා කොන්ක්‍රීට්වලින් හෝ ප්‍රිමික්ස් ආස්තරය යොදා එම කැඩී ගිය කොටස් සකසා ගැනීම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.
මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 13 ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>

2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල වැලිගම්පල T.C. කඩේ අසලින් යන මාර්ගය, වන්දන කඩේ අසල මාර්ගය, කැන්දෝපිටිය සුසාන භූමියට යන මාර්ගය සහ වගාව මාර්ගය කැඩී ඇති සියලුම තැන්වලට කොන්ක්‍රීට් හෝ ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 14 ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. මාපාකන්ද ප්‍රජාශාලාව අලුත්වැඩියා කටයුතු සඳහා - රු. 100,000.00
2. ඉඟුරුඔය උතුර සමගි ජල පාරිභෝගික සමිතිය මඟින් පාලනය කරන ජල මූලාශ්‍රයේ අඩුපාඩු සකස් කර ගැනීම සඳහා - රු. 100,000.00
3. මාපාකන්ද උතුර (පන්විල) පොදු ළිඳ සංවර්ධනය කිරීම සඳහා - රු. 100,000.00
4. ගල්පොත්ත පල්ලිය අසල අතුරු මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් දැමීම සඳහා - රු. 100,000.00

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 15 ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් සංශෝධිත යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. බලංතොට සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය සැපයුම ලබා දීම (ලංවිම ඇස්තමේන්තුව සඳහා) - රු. 50,000.00
2. නවශාන්ත ජනපද වොලිබෝල් ක්‍රීඩා පිට්ටනිය වැඩි දියුණු කිරීම - රු. 100,000.00
3. බලංතොට සිහශක්ති ක්‍රීඩා සමිතිය සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම - රු. 50,000.00
4. බලංතොට උතුර ප්‍රජාශාලාව වහලය අළුත්වැඩියාව සඳහා ඇස්බැස්ටස් ෂීට් ලබා දීම - රු. 100,000.00
5. අලුත්ගම බටහේන - බලංතොටවත්ත මාර්ගයේ ඇල හරහා බෝක්කුව සඳහා විශ්කම්භය අඩි 3 හියුම්පයිප්ප 3 ක් ලබා දිම සහ එම මාර්ගය ඉතිරි කොටස JCB යන්ත්‍රයක් යොදා කපා සංවර්ධනය කිරීම - රු. 100,000.00

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 16 ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වැවේගම ඉහළ මාර්ගයේ කැඩී ඇති කොන්ක්‍රීට් කොටස් සඳහා පැච් දමා සංවර්ධනය කිරීම - රු. 200,000.00
2. ගලබොඩ උඩ කොටසේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම - රු. 100,000.00
3. ගලබොඩ පහළ කොටසේ ක්‍රීඩා පිටියට පස් කපා පිරවීමට - රු. 100,000.00

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 17 ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. බලංතොට මුස්ලිම් පාසල අසලින් සොහොන දක්වා දිවෙන මාර්ගය ABC දමා සංවර්ධනය කිරීම - රු. 50,000.00
2. බලංතොට කලුගලපතන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා - රු. 100,000.00
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා සමිති සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම - රු. 75,000.00
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොවි සමිති සඳහා උදලු තල ලබා දීම සඳහා - රු. 75,000.00

5. බලංතොටවත්ත මැදමාර්ගය ප්‍රිමික්ස් දමා සංවර්ධන කිරීම - රු. 100,000.00

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පත්තුනුපිටිය පළමු රේල් ගේට්ටුව අසලින් සොහොන දක්වා දිවෙන පාරේ මුල් කොටස සංවර්ධනය සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වෙරළුගස්හින්න පාසැල් බෝධි මාවත - රු. 200,000.00
2. දඩුබැදිරුප්ප පාලම සකස් කිරීම - රු. 150,000.00
3. දඩුබැදිරුප්ප බෝක්කුව ඉදිකිරීම සඳහා - රු. 50,000.00

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 20 ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වැලිගම්පොල ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා - රු. 100,000.00
2. හයින්ෆෝඩ් කොට්ටුන්න ජල යෝජනා ක්‍රමය තරමක් දූරට නිම කර ඇති බැවින් ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා - රු. 100,000.00
3. හයින්ෆෝඩ් මාපාකන්ද පාරට ඉහළින් ඇති දිය හරස් කඩය 1998 සභාව මඟින් ඉදිකරන ලද ජල යෝජනාව අලුත්වැඩියා කර ගැනීමට - රු. 50,000.00
4. වැලගම්පල කැන්දපිටිය වසමේ ප්‍රජා ශාලාව අලුත්වැඩියා කර ගැනීමට - රු. 50,000.00
5. ලබුවැල් කොටුවට යන මාර්ගයේ කැඩුන තැන් කොන්ක්‍රීට් කර අලුත්වැඩියා කිරීම - රු. 50,000.00
6. කැන්දපිටිය වසමේ කෝවිලට යන පාරේ අසලින් යන පාරට - රු. 50,000.00

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 21 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. බාර්කේපල්වත්ත සිට නාවලපිටිය මාර්ගයේ ග්ලිස්ටන් කොටසේ අබලන්ව ඇති මාර්ගය සංවර්ධනය සඳහා - රු. 100,000.00
2. ටෙම්පල්ස්ටෝව්වත්ත කාලි කෝවිල අසල ඉතිරි කොටස සංවර්ධනය සඳහා - රු. 100,000.00
3. ටෙම්පල්ස්ටෝව්වත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානය සංවර්ධනය සඳහා - රු. 100,000.00
4. හයිඩ්‍රි බෝධිරාජ විහාරස්ථානයට යකඩ කබඩ් 02 ක් ලබා දිමට - රු. 50,000.00
5. හයිඩ්‍රි මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ සංවර්ධනය සඳහා - රු. 50,000.00

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 22 ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. ග්ලිස්ටන් පාර සංවර්ධනය කිරීම - රු. 200,000.00
2. කඩියන්ලෙන සිට බාර්කේපල් දක්වා පාර ජර්මික්ස් කිරීම - රු. 100,000.00
3. විග්ටන් උඩ කොටසේ යන මාර්ගයට විශ්කම්භය 1 1/2 ' හා දිග 12' 0" බෝක්කු බට දැමීම සඳහා - රු. 50,000.00
4. කේ. එම්. ජී. සුජීව මහතාගේ දියණිය වන කේ. එම්. ජී. දිල්රුක්ෂි දියණියට ගැට බෙරයක් හා තම්මැට්ටමක් ලබා දීමට - රු. 50,000.00

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 23 ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල බව්වාගම ජාතික නිවාසවල අජිත් මහතාගේ නිවස ඉදිරිපිටින් දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 24 ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. මාපාකන්ද ගල්පොත්ත පොදු ක්‍රීඩාංගණය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා - රු. 300,000.00
2. මාපාකන්ද ගල්පොත්ත සනා මහතාගෙ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා - රු. 100.000.00

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 25 ගරු මන්ත්‍රී කේ. ඕ. කුසුම්ලතා මිය
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. බෝදාදෙණිය ගමට යන මාර්ගයේ බැම්මේ ඉතිරි කොටස නිම කිරීම සඳහා - රු. 300,000.00
2. මීපිටිය අශෝකාරාම සුසීල දහම් පාසලට ඩෙස් බංකු ලබා දීම - රු. 100,000.00

ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.
මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී අයි.රාමකිලි මහතාගේ 2023 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. ඉන්වාරා මාර්ගය සංවර්ධනය සඳහා - රු. 200,000.00
2. ග්ලිස්ටන් පාර සංවර්ධනය කිරීම - රු. 100,000.00
3. වෙස්ට්හෝල් කොට්ඨාශයට වීථි ලාම්පු ලබා දීම සඳහා - රු. 100,000.00

ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී කේ. ඕ. සෝමතිලක මහතාගේ 2023 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල බෝදාදෙණිය ගමට යන මාර්ගයේ බැම්ම ඉදිකිරීම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 28 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මියගේ 2023 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. පත්තුනුපිටිය පස්බාගේ වත්ත පාර ඉහළ කොටස සංවර්ධන සඳහා - රු. 350,000.00
2. ගොන්දෙන්නාව තැපැල් හල මාර්ගයේ ඉහල තුම්මන් හන්දියෙන් වම් පසට දිවෙන මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීම - රු. 50,000.00

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 29 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මියගේ 2023 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වැවේගම අඹගහ ළඟ සිට ගලබඩ ඉහළ දක්වා පාර සංවර්ධනය සඳහා - රු. 200,000.00
2. දෙකිඳ කෝපියාවත්ත පාර සංවර්ධනය සඳහා - රු. 200,000.00

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 30 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගරු මන්ත්‍රී එච්.ඒ.එන්.සී රණසිංහ මහතාගේ 2023 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 400,000.00 ක මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. වරකාව කිරිවන්කුඹුර මාර්ගය සංවර්ධනය සඳහා - රු. 200,000.00
2. පල්ලේගම ශ්‍රී නන්දනාරාමය පන්සල බුදුමැදුර සංවර්ධනය කිරීම - රු. 100,000.00
3. පල්ලේගම පන්සලට ඉහළින් යන දන්ගහදෙණිය මාර්ගය සංවර්ධනය සඳහා - රු. 100,000.00

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 31 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
4 කණුව ගලමුදුන ජනපදයේ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය යටලවත්තේ ජේමරතන ස්වාමීන් වහන්සේට නාවලපිටිය පස්බාගේ කෝරළේ උඩබුලත්ගම උප ප්‍රධාන සංඝනායක පදවිය ලැබීම නිමිත්තෙන් ඒ සඳහා පවත්වනු ලබන උත්සවය සඳහා රු. 50,000.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 32 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා සාමාජිකයන් ලෙස සංවර්ධන නිලධාරි පී. ජී. ඩී. විජේසිංහ මෙනවිය හා ලේඛනාගාර භාරකරු සම්පත් දිසානායක මයා පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 33 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අංක 40/ඒ, නව ශාන්ත ජනපදය, බලංතොට, නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ඩී. එම්. මදුනි මංජුෂා අබේරත්න යන අය ජාතික තරුණ සේවා සභාවේ උලපනේ පුහුණු මධ්‍යස්ථානයේ 2022 ජූනි සිට 2022 දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක වූ පූර්ණ කාලීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව (NVQ LEVEL 04) පාඨමාලාව ලි. ප. අංක IT31-005 යටතේ හදාරා පාඨමාලා කාලය මාස 06 ක් සම්පූර්ණ කර ඇති බැවින් ජාතික තරුණ සේවා සභාවේ ඉල්ලීම පරිදි ඇයට මාස 06 ක ආයතනික ප්‍රායෝගික පුහුණුවක් අප සභාවේ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 34 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ඉඟුරුඔය දුම්රිය නැවතුම්පල අසලින් ඉදිකරන ලද තාවකාලික දුම්රිය හරස් මාර්ගය ඉදිකිරීමේදි කඩිනමින් කළ යුතු වූ කාර්යයක් නිසා දුම්රිය මාර්ගයට ඇතිරීම සඳහා 1" මැටල් හා ¾" මැටල් කලවම් කියුබ් 01 ක් හා ABC කියුබ් 06 ක් වැඩබිමට ගෙනගොස් දීම වෙනුවෙන් නාවලපිටිය, හෝල්ගම ලෝහාස් මැටල් ක්‍රෂර් හෝල්ඩින්ග් පුද්ගලික සමාගම වෙත රු. 105,500.000 ක් ගෙවීමටත් වැඩබිමේ අවශ්‍ය ස්ථානවලට එම ද්‍රව්‍ය ප්‍රවාහනය කර දීමට ප්‍රවාහන ගාස්තුව ලෙස රු. 25,000.00 ක් ගෙවීමටත් සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම**</u>
06 - 01 මුදල් කාරක සභාව - 2023.01.11

<u>07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, සංවර්ධන ප්‍රගතිය ඉදිරිපත් කිරිම**</u>

- 2022.12.01 දින සිට 2022.12.30 දක්වා වවුචර් අංක 1536 සිට 1835 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.

- 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පියවීම් කටයුතු සිදු කරන බැවින් 2022 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය, 2022 දෙසැම්බර් මස ලැබීම් සාරාංශය, 2022 දෙසැම්බර් මස ගෙවීම් සාරාංශය ඉදිරි සභාවට ඉදිරිපත් කරන බව දන්වන ලදී.

- 2022 දෙසැම්බර් මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 12
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 2
03. පොත් බැහැර දීම - 668
04. ව්‍යාප්ත සේවා - 2022.12.23 පුස්තකාල පාඨක තරඟ ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම
05. රැස්කළ ආදායම (පුස්තකාල) - 1,803.00
(නැණසල) - 1,000.00

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01 පරිගණක මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනු අංකය | ද්‍රව්‍යය | L. H. Chandrasekara & Brothers (Pvt) Ltd, No. 80, Kings Street, Kandy | | | Base HP (Pvt) Ltd, No. 219/A, Peradeniya road, Kandy | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය |
| 1 | Desktop Computer | Dell Vostro 3888 | 325,710.00 | 3 year | Option I | | |
| | | | | | Hp 280 G9 i3 Desktop computer with 19" inch monitor | 259,000.00 | |
| | | | | | Hp 280 G9 i3 Desktop computer with 22" inch monitor | 279,000.00 | |
| | | | | | Option II | | |
| | | Office pack | 37,450.00 | 6 months | Hp 280 G9 i5 Desktop computer with 19" inch monitor | 309,000.00 | |
| | | | | | Hp 280 G9 i5 Desktop computer with 22" inch monitor | 329,500.00 | |
| | | | | | Option III | | |
| | | | | | Hp 280 G9 i7 Desktop computer with 19" inch monitor | 371,500.00 | |
| | | | | | Hp 280 G9 i7 Desktop computer with 22" inch monitor | 391,500.00 | |
| | | | | | | | |
| 2 | Mouse | Dell | 1,350.00 | 6 months | Acer/Techpro | 950.00 | 6 months |
| 3 | Key Board | Deluk | 1,860.00 | 2 year for unit 1 year for battery | HP/Dell | 3,000.00 | 6 months |
| 4 | UPS | DCP | 12,450.00 | | SCP650VA | 14,500.00 | 2 years |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 අභ්‍යාස පොත් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| | වර්ගය | පේපර්ලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම, අංක 14, හරස් වීදිය, මහනුවර | ශ්‍රී ලංකා ස්ටෝර්ස්, නො. 30, කොත්මලේ පාර, නාවලපිටිය | L. H. Chandrasekara & Brothers (Pvt) Ltd, No. 80, Kings Street, Kandy - Atlas | ද ලංකා ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්, 223/1/1, ඩී. එස්. සේනානායක | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, නො. 449, විලියම් ගොපල්ලව මාවත, මහනුවර | සෙන්ට්‍රල් ස්ටේෂනරීස්, 31, කොටුගොඩැල්ල වීදිය, මහනුවර |
|---|---|---|---|---|---|---|---|

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | වීදිය, මහනුවර | | | | | |
| | | වැට් රහිත | වැට් සහිත | වර්ගය | මිල | වැට් රහිත | වැට් සහිත | | | වර්ගය | මිල | වර්ගය | මිල |
| 1 | | තනිරූල් - Exercise Book | | | | | | | | | | | |
| i | පිටු 40 | 54.69 | 62.89 | Atlas | 73.80 | 52.97 | 60.92 | | 56.00 | Nalaka | 61.01 | Atlas | 67.50 |
| | | | | Dumindu | 60.00 | | | | | | | | |
| ii | පිටු 80 | 77.00 | 88.55 | Atlas | 98.40 | 79.45 | 91.37 | | 91.00 | Nalaka | 110.00 | Atlas | 90.00 |
| | | | | Dumindu | 80.00 | | | | | | | | |
| iii | පිටු 120 | 110.00 | 126.50 | Atlas | 123.00 | 120.45 | 138.52 | | 128.00 | Nalaka | 155.01 | Atlas | 135.00 |
| | | | | Dumindu | 120.00 | | | | | | | | |
| iv | පිටු 160 | 142.00 | 163.30 | Atlas | 180.40 | 157.77 | 181.44 | | 164.00 | Nalaka | 215.51 | Atlas | 180.00 |
| | | | | Dumindu | 160.00 | | | | | | | | |
| v | පිටු 200 | 182.00 | 209.30 | Atlas | 241.90 | 192.00 | 220.80 | | 212.00 | Nalaka | 265.01 | Atlas | 217.50 |
| | | | | Dumindu | 200.00 | | | | | | | | |
| 2 | | තනිරූල් - CR Book | | | | | | | | | | | |
| i | පිටු 40 | 87.00 | 100.05 | Atlas | 106.60 | 96.00 | 110.40 | | 104.00 | Nalaka | 120.01 | Atlas | 108.75 |
| | | | | Dumindu | 104.00 | | | | | | | | |
| ii | පිටු 80 | 170.00 | 195.50 | Atlas | 213.20 | 172.15 | 197.97 | | 175.00 | Nalaka | 233.00 | Atlas | 195.00 |
| | | | | Dumindu | 160.00 | | | | | | | | |
| iii | පිටු 120 | 207.00 | 238.05 | Atlas | 262.40 | 231.74 | 266.50 | | 256.00 | Nalaka | 346.00 | Atlas | 262.50 |
| | | | | Dumindu | 240.00 | | | | | | | | |
| iv | පිටු 160 | 321.00 | 369.15 | Atlas | 405.90 | 327.74 | 376.90 | | 322.00 | Nalaka | 443.50 | Atlas | 371.25 |
| | | | | Dumindu | 328.00 | | | | | | | | |
| v | පිටු 200 | 386.00 | 443.90 | Atlas | 487.90 | 393.92 | 453.01 | | 404.00 | Nalaka | 552.00 | Atlas | 446.25 |
| | | | | Dumindu | 408.00 | | | | | | | | |
| 3 | | කොටුරූල් - Exercise Book | | | | | | | | | | | |
| i | පිටු 40 | 52.00 | 59.80 | Atlas | 73.80 | 52.97 | 60.92 | | 56.00 | Nalaka | 61.01 | Atlas | 67.50 |
| | | | | Dumindu | 60.00 | | | | | | | | |
| ii | පිටු 80 | 77.00 | 88.55 | Atlas | 98.40 | 79.45 | 91.37 | | 91.00 | Nalaka | 110.00 | Atlas | 90.00 |
| | | | | Dumindu | 80.00 | | | | | | | | |
| iii | පිටු 120 | 110.00 | 126.50 | Atlas | 123.00 | 120.45 | 138.52 | | 128.00 | Nalaka | 155.01 | Atlas | 135.00 |
| | | | | Dumindu | 120.00 | | | | | | | | |
| iv | පිටු 160 | 142.00 | 163.30 | Atlas | 180.40 | 157.77 | 181.44 | | 164.00 | Nalaka | 215.51 | Atlas | 180.00 |
| | | | | Dumindu | 160.00 | | | | | | | | |
| v | පිටු 200 | 182.00 | 209.30 | Atlas | 241.90 | 192.00 | 220.80 | | 212.00 | Nalaka | 265.01 | Atlas | 217.50 |
| | | | | Dumindu | 200.00 | | | | | | | | |
| 4 | | තනිරූල් - CR Book | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| i | පිටු 40 | 87.00 | 100.05 | Atlas | 106.60 | 96.00 | 110.40 | | 104.00 | Nalaka | 120.01 | Atlas | 108.75 |
| | | | | Dumindu | 104.00 | | | | | | | | |
| ii | පිටු 80 | 170.00 | 195.50 | Atlas | 213.20 | 172.15 | 197.97 | | 175.00 | Nalaka | 233.00 | Atlas | 195.00 |
| | | | | Dumindu | 160.00 | | | | | | | | |
| iii | පිටු 120 | 207.00 | 238.05 | Atlas | 262.40 | 231.74 | 266.50 | | 256.00 | Nalaka | 346.00 | Atlas | 262.50 |
| | | | | Dumindu | 240.00 | | | | | | | | |
| iv | පිටු 160 | 321.00 | 369.15 | Atlas | 405.90 | 327.74 | 376.90 | | 322.00 | Nalaka | 443.50 | Atlas | 371.25 |
| | | | | Dumindu | 328.00 | | | | | | | | |
| v | පිටු 200 | 386.00 | 443.90 | Atlas | 487.90 | 393.92 | 453.01 | | 404.00 | Nalaka | 552.00 | Atlas | 446.25 |
| | | | | Dumindu | 408.00 | | | | | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 12' ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංක | විස්තරය | මහනුවර ඒජන්සීස්, මහනුවර | | නිව් ලංකා හාඩ්වෙයාර්, ගිනිගත්හේන පාර, බලංතොට, රඹුක්පිටිය | මහවැලි හාඩ්වෙයාර්, ගිනිගත්හේන පාර, බලංතොට, නාවලපිටිය |
|---|---|---|---|---|---|
| | | වර්ගය | මිල | | |
| 1 | 12' ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු | Ramco | 6,890.00 | 7,525.00 | 7,400.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති මහනුවර ඒජන්සීස්, මහනුවර යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 04 ග්‍රීස් බකට් එකක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අනු අංක | විස්තරය | කැළුම් කන්ස්ට්‍රක්ෂන්, කලපිටිය, හැඳුනුවැව, හැටන් | ආර්. එම්. නයන්ත කැළුම්, කටාරන්දන, මල්දෙණිය | සීතා ඔටෝ සර්විස්, කොත්තුණුගොඩ, කලපිටියගම, හැඳුනුවැව |
|---|---|---|---|---|
| 1 | 18 kg බරැති ග්‍රීස් බකට් එකක් | 35,000.00 | 31,000.00 | 40,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති ආර්. එම්. නයන්ත කැළුම්, කටාරන්දන, මල්දෙණිය යන අයගෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**09. වෙනත් කරුණු**

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 11.40 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව